**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු තනතුර සඳහා බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය</u>**

07 FEB 2022

1. සම්බන්ධ වන ආයතන

| | | |
|---|---|---|
| 1.1. දෙපාර්තමේන්තුව | යොමු අංකය | දිනය - |
| 1.2. අමාත්‍යාංශය - බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය | යොමු අංකය - 1/6/25 (II) | දිනය -2022.01.12 |
| 1.3. කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම | යොමු අංකය DMS/WP/0210 | දිනය - 2018.06.28 |
| 1.4. ප්‍රධාන ලේකම් (බ.ප.) නිර්දේශය | යොමු අංකය WP/PTR/12/2/6/1-V | දිනය 2022/01/31 |
| 1.5. වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය | දිනය |
| 1.6. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය WPC/PSC/MHP/01/04/18 | දිනය 2022.04.07 |
| 1.7. ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය | යොමු අංකය | දිනය |

2. පත්කිරීම්

2.1 පත්කිරීමේ බලධරයා - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2.2 ක්‍රියාත්මක වන දිනය - මෙම පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

3. සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය - අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික

3.2. ශ්‍රේණි - III, II, I

3.3. පැවරෙන කාර්යයන් පිළිබඳ පොදු නිර්වචනය

"ආයතනයන්හි විධායකයේ කාර්යයන්ට උපස්ථම්භක වන සේ විධායකය විසින් නිශ්චිත කොට පවරනු ලබන පිරිස් පාලනය, මුදල් භාරකාරීත්වය හා මුදල් පරිහරණය, අධීක්ෂණය හා මෙහෙයුම් යන කාර්යයන් ඇතුළත් බහුකාර්යය ස්වරූපයේ කාර්යයන් ඉටුකරන සේවා ගණයකි."

3.4. කාර්යයන් පැවරීම

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදුනොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත යෝග්‍යතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට ආයතන ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.**
යොමු අංකය : GOS/ADM/05/6/374
දිනය : 2022.04.26

4. තනතුරේ ස්වභාවය - ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

5. වැටුප්

5.1. වැටුප් කේත අංකය -MN 3- 2016 (රා.ප.ච. 3/2016 අනුව)

5.2. වැටුප් පරිමාණය - රු. 31040–10x445- 11x660-10x730-10x750-57550

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| තනතුර හා ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| ක්‍රීඩා පුහුණුකරු III | පියවර 01 | 31040/- |
| ක්‍රීඩා පුහුණුකරු II | පියවර 12 | 36150/- |
| ක්‍රීඩා පුහුණුකරු I | පියවර 23 | 43480/- |

6. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ක්‍රීඩා පුහුණුකරු | III, II, I | 16 | 1. ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථාන විධිමත්ව පවත්වාගෙන යාම<br>I. පුහුණු මධ්‍යස්ථානයට ලබාදී තිබෙන සියලු ම ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ නඩත්තු කිරීම<br>II. පුහුණු මධ්‍යස්ථානයට අයත් සෙසු භාණ්ඩ හා දේපළ ආරක්ෂා කිරීම<br>2. ක්‍රීඩා පුහුණු කිරීම් ඉදිරි වැඩසටහන් අනුව පවත්වාගෙන යාම<br>3. ක්‍රීඩා විෂයයට අදාළ සැලසුම්<br>4. පහත ලේඛන පවත්වාගෙන යාම<br>I. ක්‍රීඩක ජීවදත්ත වාර්තා<br>II. ක්‍රීඩක කුසලතා වාර්තා<br>III. පර්යේෂණ වාර්තා<br>IV. ක්‍රීඩා පැමිණීමේ ලේඛන<br>5. ක්‍රීඩා තරග, පුහුණු කඳවුරු සංවිධානය හා තරග විනිශ්චය<br>6. ක්‍රීඩා අධ්‍යක්ෂවරයාගේ අනුමැතියට යටත්ව පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව හෝ වෙනත් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන පිළිගත් ආයතන විසින් පවත්වනු ලබන ක්‍රීඩා ව්‍යාපෘතීන් සඳහා සහාය හා උපදෙස් ලබාදීම |



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GIOS/ADM/08/6/374
දිනය : 2022.04.26

| | | | |
|---|---|---|---|
| | | | 7. පුහුණු කටයුතු අධීක්ෂණය හා ක්‍රීඩා නිලධාරීන්ට අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබාදීම<br>8. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා මට්ටම්, ප්‍රගතිය පරීක්ෂා කිරීමට අදාළ පුහුණුකරුවන්ගේ සහයෝගයෙන් තාක්ෂණික ඇගයීම් පරීක්ෂණ සංවිධානය<br>9. පුහුණු මධ්‍යස්ථානයන්ට ලබාදී තිබෙන සියලු ම ක්‍රීඩා භාණ්ඩ සහ උපකරණ නඩත්තු කිරීම, ගබඩා කර තිබීම හා නිකුත් කිරීම පිළිබඳ අධීක්ෂණය<br>10. පුහුණු මධ්‍යස්ථානයන්ට අයත් සෙසු භාණ්ඩ හා දේපළ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම<br>11. භාණ්ඩ වට්ටෝරු පොත තුලනය කරමින් පවත්වාගෙන යාම<br>12. පුහුණු මධ්‍යස්ථානයන්හි ක්‍රීඩාපිටි තාක්ෂණ අවශ්‍යතාවන් සපුරාලීම<br>13. සියලු පුහුණු මධ්‍යස්ථාන කටයුතු පිළිබඳව ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම<br>14. ක්‍රීඩා අධ්‍යක්ෂවරයාගේ අනුමැතියට යටත්ව පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව හෝ වෙනත් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන පිළිගත් ආයතන විසින් පවත්වනු ලබන ක්‍රීඩා ව්‍යාපෘති සඳහා සහාය හා උපදෙස් ලබාදීම |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව - ශ්‍රේණිගත උසස් කිරීමේ කාර්යය සඳහා III, II සහ I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

7. බඳවාගැනීමේ ක්‍රමය -

7.1 බඳවාගන්නා ප්‍රතිශතය

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නැත |
| සීමිත | 100% |
| කුසලතා | අදාළ නැත |

7.2 විවෘත බඳවාගැනීම - අදාළ නොවේ

7.3 සීමිත බඳවාගැනීම

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : EOS/ADM/08/6/374
දිනය : 2022.04.26

7.3.1 බඳවාගන්නා ශ්‍රේණිය - III ශ්‍රේණිය

7.3.2 සුදුසුකම් -

7.3.2.1 අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

I. පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් ක්‍රීඩා නිලධාරී තනතුරට අදාළව 7.2.2.1 හි (අ) හෝ (ආ) යටතේ සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

සහ

II. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ/හය (05/06) මට්ටමේ වන්නා වූ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික ඩිප්ලෝමාවක් ලබා තිබීම

සහ

III. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිගත් ආයතනයක් විසින් අදාළ ක්‍රීඩාව සඳහා පවත්වනු ලැබූ මාස තුනකට (03) නොඅඩු පුහුණුකරු පාඨමාලාවක් හදාරා සමත් වී තිබීම හෝ ක්‍රීඩා පනත යටතේ අදාළ ක්ෂේත්‍රයට නියමිත ක්‍රීඩා සංගමය විසින් නිකුත් කරන ලද පුහුණුකරු බලපත්‍රයක් ලබා තිබීම

7.3.2.2 පළපුරුද්ද - බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා නිලධාරී තනතුරේ ස්ථිර කරන ලද, වසර අටක (08) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ වැටුප් වර්ධක අටක් (08) උපයාගෙන ඇති නිලධාරියෙකු වීම

7.3.2.3 කායික සුදුසුකම් - බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වියයුතුය.

7.3.2.4 වෙනත් සුදුසුකම් -

I. පත්වීම ස්ථිර කර තිබීම
II. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම
III. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා තිබීම
IV. පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම
V. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම
VI. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට 7.3.2 යටතේ දක්වා ඇති සියළුම සුදුසුකම් සෑම ආකාරයකින් සම්පූර්ණ කර තිබිය යුතුය

**ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.**
ලොනු අංකය : 605/ADM/05/6/314
දිනය : 2022.04.26

7.3.3 වයස - දැනට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන්නන්ගෙන් බඳවාගන්නා බැවින් වයස් සීමාව අදාළ නොවේ.

7.3.4 බඳවාගැනීමේ ක්‍රමය - සුදුසුකම්ලත් අයදුම්කරුවන් ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ඉන් ලබාගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය - අදාළ නොවේ

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය - අදාළ නොවේ

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය - සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලන නිර්ණායක ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලැබේ.

7.3.4.4 ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| අතිරේක සේවා කාලය | 30 |
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 |
| ක්‍රීඩා නිලධාරී තනතුරේ දක්වන ලද දක්ෂතා | 20 |
| ක්‍රීඩා තරඟ විනිශ්චය/ තරඟ සංවිධානය පිළිබඳ අතිරේක පළපුරුද්ද | 20 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතා | 05 |
| එකතුව | 100 |

(ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ ඇමුණුම 01හි දක්වා ඇත)

7.3.4.5. ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා - පත්වීම් බලධාරියා

7.3.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය - අභ්‍යන්තර දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

සටහන - මෙම තනතුරට 100%ක්ම බඳවාගත යුත්තේ බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා නිලධාරීන් අතුරින් පමණක් විය යුතුය.

7.4. කුසලතා පදනම මත බඳවාගැනීම - අදාළ නොවේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/08/6/374
දිනය : 2022.04.26

8. කාර්යක්ෂමතා කඩඉම්

8.1.

| කුමන කාර්යක්ෂමතා කඩඉම් ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව, වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු තනතුරට බඳවාගෙන වසර 3ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණ (ඇමුණුම 2) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු II ශ්‍රේණියට උසස් වී වසර 3ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණ (ඇමුණුම 3) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු I ශ්‍රේණියට උසස් වී වසර 5ක් ගතවීමට පෙර | ප්‍රායෝගික පරීක්ෂණ (ඇමුණුම 4) |

8.2. කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද?

වසරකට වරක් හෝ අවශ්‍යතාව පරිදි

8.3. කාර්යක්ෂමතා කඩඉම්වලටඅදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන් ද?

1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය
} පත්වීම් බලධරයා හෝ පත්වීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක්/පුද්ගලයන්

9. භාෂා ප්‍රවීණතාව

9.1.

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් නියමිත භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබාගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රා.ප.ච.18/2020 හා අනුශාංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය. |
| 3. සන්ධාන භාෂාව (අදාළ වන්නේ නම් පමණි) | අදාළ නැත. |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GOS/ADM/08/6/374
දිනය : 2022.04.26

10. ශ්‍රේණි උසස් කිරීම

10.1 අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

14 MAR 2022

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම

10.1.1.1. සපුරාලිය යුතු සුදුසුකම්

i. පත්වීම ස්ථිර කර තිබීම

ii. අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණියේ අවම වශයෙන් වසර 10ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලසීමාවට අදාළ සියලු වැටුප් වර්ධක උපයා ගෙන තිබීම

iii. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහක් (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම

vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම

10.1.1.2. උසස් කිරීමේ ක්‍රමය -

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම 05) අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, III ශ්‍රේණියේ වසර 10ක සේවා කාලය සපුරන දිනය හෝ සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

10.2 අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම

10.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1.සපුරාලිය යුතු සුදුසුකම්

i. අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලයට අදාළ සියලු ම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

ii. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

iii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්වී තිබීම

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/08/6/374
දිනය : 2022.04.26

10.2.1.2. උසස් කිරීමේ ක්‍රමය -

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම 05) අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූවිට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, II ශ්‍රේණියේ වසර දහයක (10) සේවා කාලය හෝ සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම කරනු ලැබේ.

11. තනතුරුවලට පත්කිරීම - අදාළ නොවේ.

**12. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට නොහොත් නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝගවලට ද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළයුතුය.

**13. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වේනොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

**14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය -**

මෙම බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. කෙසේ වුව ද අන්තර්ග්‍රහණය හේතුවෙන් නිලධාරියාගේ වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදුනොවිය යුතු ය.

i. මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණියේ සිටින නිලධාරීන් නව පරිපාටිය යටතේ III ශ්‍රේණියට ද,

ii. මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට ක්‍රීඩා පුහුණුකරු II ශ්‍රේණියේ සිටින නිලධාරීන් නව පරිපාටිය යටතේ II ශ්‍රේණියට ද,

iii. මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට ක්‍රීඩා පුහුණුකරු I ශ්‍රේණියේ සිටින නිලධාරීන් නව පරිපාටිය යටතේ I ශ්‍රේණියට ද,
අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ගිරප/ADM/08/6/374
දිනය : 2022.04.26

**15.** මෙම පරිපාටියේ විධිවිධාන සලකා නොමැති යම් කරුණක් වෙතොත් බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.

07 FEB 2022

**16.** අන්තර්කාලීන විධිවිධාන

16.1 පැරණි බඳවාගැනීමේ පරිපාටියට යටතේ ඇති පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්වී ඇති නිලධාරීන් මෙම පරිපාටිය යටතේ අලුතින් ඇතුළත් කර ඇති පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්වූවා සේ සලකා කටයුතු කරනු ලැබේ.

16.2 පැරණි බඳවාගැනීමේ පරිපාටිය යටතේ ඇති පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්වී නොමැති නිලධාරීන් සඳහා මෙම බඳවාගැනීමේ පරිපාටිය යටතේ අලුතින් ඇතුළත් කර ඇති පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීමට මෙම බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දින සිට වසර 3ක සහන කාලයක් ලබාදෙනු ලැබේ.

16.3 මෙම බඳවාගැනීමේ පරිපාටිය යටතේ අලුතින් ඇතුළත් කර ඇති තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට පෙනීසිටිය යුතු සියලුම නිලධාරීන් අදාළ තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත පරිදි සමත් වියයුතුය.

**ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.**

**ගොනු අංකය :** ගුදු/ADM/08/6/374

**දිනය :** 2022 . 04 . 26

**17.** **අර්ථ නිරූපණ:**

**"සතුටුදායක සේවා කාලය":**

(i) පළාත් සභා රාජ්‍ය සේවයේ සේවකයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටුකිරීම මගින් ද, සමත් වියයුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මගින් ද, සිදුකළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළ දී උපයාගත යුතුව තිබූ සියලු ම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදුනොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

(ii) නිලධාරියා වෙත ලබාදිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩු කොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාලපරිච්ඡේදයක් වේ නම් එය ද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා විනය කාර්යය පරිපාටි සංග්‍රහය, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදුකරනු ලැබූ දින සිට වසර තුනක කාලයක් ද සහ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා විනය කාර්යය පරිපාටි සංග්‍රහය, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදුකරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේ දී බැහැර කළයුතු වන්නේය.

**"සක්‍රීය සේවා කාලය":**

"සක්‍රීය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන් ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාලපරිච්ඡේදයන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

**"නියමිත දිනට" :**

අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු දිනය, "නියමිත දිනය" ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස්වීම්වල දී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් වන නිලධාරීන්ට බඳවාගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළයුතුය.

උදා : වසර තුනක දී සමත් වියයුතු කාර්යක්ෂමතා කඩඉම වසර හතරකින් සමත් වුවහොත් වසර දහයකින් ලැබිය යුතු උසස්වීම් ලැබෙනුයේ වසර එකොළහකිනි.

| | | | |
|---|---|---|---|
| සකස් කළේ | :- .............................. | පරීක්ෂා කළේ | :- .............................. |
| නම | :- එච්.අයි.එස්. හේවාගම | නම | :- රවිකා රත්නායක |
| තනතුර | :- කළමනාකරණ සේවා නිලධාරී | තනතුර | :- පරිපාලන නිලධාරී |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය - 2022.01.12

අත්සන :- ..............................

නම :- සෙව්වන්දි හෙට්ටිආරච්චි

තනතුර :- ක්‍රීඩා අධ්‍යක්ෂ (වැ.බ)

සෙව්වන්දි හෙට්ටිආරච්චි
ක්‍රීඩා අධ්‍යක්ෂ (වැ.බ.)
නිලමුද්‍රාව බස්නාහිර පළාත් අධ්‍යාපන සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය
204, 2 වන මහල, නව පළාත් සභා කාර්යාල සංකීර්ණය,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

යොමු අංකය- 1/6/25(II)

බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයෙ හි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු තනතුර සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය - 2022.01. 12

අත්සන - ..............................

සිරිසෝම ලොකුවිතාන

ලේකම්

බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය

නිලමුද්‍රාව

**ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.**

යොමු අංකය : GOS/ADM/08/6/374

දිනය : 2022.04.26

යොමු අංකය - ශ.ප./PTP/12/P/6/1-V
07 FEB 2022

බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයෙ හි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු තනතුර සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය - 2022/01/31

අත්සන - ..................................
නම - .................................. 01/31

ප්‍රධාන ලේකම්

නිලමුද්‍රාව
ජේ. එම්. සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම් (බස්නාහිර පළාත)
ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල

යොමු අංකය - ..................................

බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයෙ හි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු තනතුර සඳහා වන මෙම බඳවාගැනීමේ පරිපාටිය බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

දිනය - 2022.04.07

අත්සන - ..................................
නම - ..................................

ලේකම්

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

නිලමුද්‍රාව
තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

යොමු අංකය - GOS/ADM/08/06/374

බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයෙ හි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු තනතුර සඳහා වන මෙම බඳවාගැනීමේ පරිපාටිය 2022.04.26 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

දිනය - 2022/04/26

අත්සන - ..................................
නම - ..................................

ආණ්ඩුකාර ලේකම්

නිලමුද්‍රාව
සී. සෝමසිරි
ආණ්ඩුකාර ලේකම්
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර කාර්යාලය
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
බත්තරමුල්ල

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GOS/ADM/08/6/374
දිනය : 2022.04.26

ඇමුණුම 1

<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු තනතුර සඳහා බඳවාගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය</u>

1. පරීක්ෂණයේ නම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු තනතුර සඳහා බඳවාගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

2. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | | ලබා දියයුතු උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| අතිරේක සේවා කාලය | තනතුරට බඳවාගැනීමට සලකා බලනු ලබන සේවා කාලයට අතිරේකව සේවය කර ඇති කාලය සඳහා වසරකට ලකුණු 03 බැගින් උපරිම වසර 10ක් සඳහා | | 30 |
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | I. රජයේ පිළිගත් ආයතනයක් මගින් පවත්වනු ලබන ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය හෝ ක්‍රීඩා කළමනාකරණය හෝ පරිපාලනය පිළිබඳව සති දෙකකට (02) වඩා වැඩි පාඨමාලා (එක් පාඨමාලාවකට ලකුණු 3 බැගින් උපරිම පාඨමාලා 2ක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ) | 06 | 25 |
| | II. රජයේ පිළිගත් ආයතනයක් මගින් පවත්වනු ලබන ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය හෝ ක්‍රීඩා කළමනාකරණය හෝ පරිපාලනය පිළිබඳව මාස හයකට (06) නොඅඩු පාඨමාලා (එක් පාඨමාලාවකට ලකුණු 4 බැගින් උපරිම පාඨමාලා 2ක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ) | 08 | |
| | III. රජයේ පිළිගත් ආයතනයක් මගින් පවත්වනු ලබන ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය හෝ ක්‍රීඩා කළමනාකරණය හෝ පරිපාලනය පිළිබඳව වසරක් හෝ ඊට වැඩි පාඨමාලා (එක් පාඨමාලාවක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ) | 15 | |
| | IV. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් ආයතනයක් හෝ විශ්වවිද්‍යාලයක් මගින් ලබා ඇති ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය හෝ ක්‍රීඩා කළමනාකරණය හෝ පරිපාලනය පිළිබඳ උපාධිය | 25 | |
| | සැ.යු: පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් ක්‍රීඩා නිලධාරී තනතුරට අදාළව 7.2.2.1 යටතේ වන සංලක්ෂයෙහි සඳහන් ක්‍රීඩා ඩිප්ලෝමා අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා හදාරා ඇති පාඨමාලා සඳහා මෙහිදී ලකුණු දෙනු නොලැබේ.<br>(ඉහත සුදුසුකම්වලින් ඉහළ ම සුදුසුකම සඳහා පමණක් ලකුණු දෙනු ලැබේ) | | |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : ශිලප/ලපම/08/6/374
දිනය : 2022.04.26

| | | | | |
|---|---|---|---|---|
| ක්‍රීඩා නිලධාරී තනතුරේ දක්වන ලද දක්ෂතා | I. පූර්වාසන්න වසර තුන (3) ඇතුළත දිස්ත්‍රික් ක්‍රීඩා උළෙලේදී විධිමත් පරිදි තමා වෙත රාජකාරී පවරා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි ජයග්‍රහණය වෙනුවෙන් දක්වන ලද සක්‍රීය දායකත්වය | | 08 | 20 |
| | a) දිස්ත්‍රික් ක්‍රීඩා උළෙලේ සමස්ථ ශූරතාවය දිනා ගැනීම | 08 | | |
| | b) දිස්ත්‍රික් ක්‍රීඩා උළෙලේ සමස්ථ අනුශූරතාවය දිනා ගැනීම | 06 | | |
| | c) දිස්ත්‍රික් ක්‍රීඩා උළෙලේ මලල ක්‍රීඩා ශූරතාවය දිනා ගැනීම | 06 | | |
| | d) දිස්ත්‍රික් ක්‍රීඩා උළෙලේ මලල ක්‍රීඩා අනුශූරතාවය දිනා ගැනීම | 04 | | |
| | e) දිස්ත්‍රික් ක්‍රීඩා උළෙලේ කණ්ඩායම් තරග ශූරතාවය දිනා ගැනීම | 06 | | |
| | f) දිස්ත්‍රික් ක්‍රීඩා උළෙලේ කණ්ඩායම් තරග අනුශූරතාවය දිනා ගැනීම | 04 | | |
| | (පූර්වාසන්න වසර තුන ඇතුළත ලබා ඇති ඉහළම ජයග්‍රහණය සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ) | | | |
| | II. පූර්වාසන්න වසර 5ක් තුළ ක්‍රීඩා නිලධාරියෙකු ලෙස විධිමත් පරිදි තමා වෙත රාජකාරී පවරා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ක්‍රීඩා කටයුතු ප්‍රවර්ධනය වෙනුවෙන් නිර්මාණාත්මකව ක්‍රියාත්මක කල නව වැඩසටහන්<br>(මෙය සනාථ කිරීම සඳහා ශ්‍රව්‍ය, දෘශ්‍ය, ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් අදාල තොරතුරු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය) | | 08 | |
| | III. ක්‍රීඩා සමාජ පිහිටුවීම<br>පූර්වාසන්න වසර 3 තුළ විධිමත් පරිදි තමා වෙත රාජකාරී පවරා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාවෙන් 75% ක වසම් ප්‍රමාණයක ක්‍රියාකාරී ක්‍රීඩා සමාජ පිහිටුවා තිබීම.<br>(ඉහත කරුණු සංඛ්‍යා ලේඛන සහිතව ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කල ලිපියක් මගින් තහවුරු කල යුතුය) | | 04 | |
| ක්‍රීඩා තරග විනිශ්චය/ තරග සංවිධානය පිළිබඳ අතිරේක පළපුරුද්ද | I. බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය හැර වෙනත් රාජ්‍ය ආයතනයක් මගින් පැවැත්වූ ක්‍රීඩා තරගයක තරග සංවිධාන කටයුතු භාරව කටයුතු කිරීම<br>(මෙය අදාල රාජ්‍ය ආයතනයෙන් නිකුත් කරනු ලබන ලිපියක් මගින් තහවුරු කල යුතුය) | | 10 | 20 |
| | II. තරග විනිශ්චය | | 10 | |
| | a) ජාතික මට්ටමින් ක්‍රීඩා පුහුණුකරුවකු හෝ පරිපාලකයෙකු හෝ සංවිධායකවරයෙකු හෝ විනිශ්චයකරුවකු ලෙස කටයුතු කිරීම | 05 | | |
| | b) දකුණු ආසියාතික මට්ටමින් ක්‍රීඩා පුහුණුකරුවකු හෝ පරිපාලකයෙකු හෝ සංවිධායකවරයෙකු හෝ විනිශ්චයකරුවකු ලෙස කටයුතු කිරීම | 08 | | |

07 FEB 2022

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : GOS|ADM|08|6|374
දිනය : 2022.04.26

| | | | | |
|---|---|---|---|---|
| | c) ආසියාතික/පොදු රාජ්‍ය මණ්ඩලීය ලෝක ශූරතා/ ඔලිම්පික් මට්ටමින් ක්‍රීඩා පුහුණුකරුවකු හෝ පරිපාලකයෙකු හෝ සංවිධායකවරයෙකු හෝ විනිශ්චයකරුවකු ලෙස කටයුතු කිරීම | 10 | | |
| | • මෙම කරුණු සනාථ කිරීම සඳහා විධිමත් තහවුරු කිරීම් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.<br>• ඉහත සුදුසුකම්වලින් ඉහළ ම සුදුසුකම සඳහා පමණක් ලකුණු දෙනු ලැබේ. | | | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | | | | 05 |
| එකතුව | | | | 100 |

සටහන : ලකුණු ලබාගන්නා කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සඳහා පත්කරනු ලැබේ.

03. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා : පත්වීම් බලධරයා

04. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : අවශ්‍යතාව පරිදි

අත්සන - ..............................................

නම - සිරිසෝම ලොකුවිතාන

තනතුර - අමාත්‍යාංශ ලේකම්

දිනය - 2022.01. 12

නිලමුද්‍රාව

[illegible]

204, 2 වන මහල, [illegible] සංකීර්ණය,

ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

ගොනු අංකය : GOS/ADM/08/6/374

දිනය : 2022.05.26

ඇමුණුම 2

07 FEB 2022

<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණියේ පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත)</u>

1. විභාගයේ/වෘත්තීය පරීක්ෂණයේ නම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණියේ පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත)

2. විභාගය පිළිබඳ විස්තර : පත්වීම් දින සිට වසර 3ක් ඇතුළත සමත් වියයුතුය.

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. පුහුණු න්‍යාය ශාරීරික යෝග්‍යතාව සහ පුහුණු සැලසුම් | පැය 1 1/2 | 100 | 40% |
| 2. පුහුණුකරු තනතුරට අදාළ විනිසුරු බලපත්‍රයක් ලබා තිබීම | | | |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලයලත් ආයතනයක් / පුද්ගලයන්

4. විභාගය පවත්වනු ලබන කාලසීමාව : වසරකට වරක් හෝ අවශ්‍යතාව පරිදි

5 විභාගය සඳහා වන නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. පුහුණු න්‍යාය ශාරීරික යෝග්‍යතාව සහ පුහුණු සැලසුම් | පුහුණු න්‍යාය ශාරීරික යෝග්‍යතාව සහ පුහුණු සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුම |
| 2. පුහුණුකරු තනතුරට අදාළ විනිසුරු බලපත්‍රයක් ලබා තිබීම | අදාළ ජාතික ක්‍රීඩා සංගමය විසින් ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පවත්වා අදියර 01, අදියර 02, අදියර 03 වශයෙන් නිකුත් කරන බලපත්‍ර සලකා බලනු ලැබේ. |

**ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.**

ලේඛන අංකය : ගිපද/ආපම/0ද/ළ/374

දිනය : 2022.04.21

අත්සන - ..........................................

නම - සිරිසෝම ලොකුවිතාන

තනතුර - අමාත්‍යාංශ ලේකම්

දිනය - 2022.01.17

නිලමුද්‍රාව

සිරිසෝම ලොකුවිතාන
ලේකම්
බස්නාහිර පළාත් ...
කලා කටයුතු, ක්‍රීඩා හා ...
...
204, 2 වන මහල, නව පළාත් සභා ... සංකීර්ණය,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

ඇමුණුම 3

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු නිලධාරි II ශ්‍රේණියේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය</u>**

1. විභාගයේ/වෘත්තීය පරීක්ෂණයේ නම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු II ශ්‍රේණියේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. විභාගය පිළිබඳ විස්තර : (II ශ්‍රේණියට පත්වී වසර 03ක් ගතවීමට පෙර)

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුලු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. පත්වීම් ලිපියේ හෝ රාජකාරි පැවරීමේ ලිපියේ වගකීම් පවරා ඇති ක්‍රීඩාවට අදාලව පුහුණු සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුම | පැය 01 | 100 | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලයලත් ආයතනයක් / පුද්ගලයන්

4. විභාගය පවත්වනු ලබන කාලසීමාව : වසරකට වරක් හෝ අවශ්‍යතාව පරිදි

5. විභාගය සඳහා වන නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. පත්වීම් ලිපියේ හෝ රාජකාරි පැවරීමේ ලිපියේ වගකීම් පවරා ඇති ක්‍රීඩාවට අදාලව පුහුණු සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුම | වාර්ෂික, මාසික, දෛනික පුහුණු සැලසුම් පිළියෙළ කිරීම පිළිබඳ දැනුම |

අත්සන - ..........................................

නම - සිරිසෝම ලොකුවිතාන

තනතුර - අමාත්‍යංශ ලේකම්

දිනය - 2022.01.12

නිලමුද්‍රාව

සිරිසෝම ලොකුවිතාන
ලේකම්
බස්නාහිර පළාත් ...
...
204, 2 වන මහල, නව පළාත් සභා කාර්යාල සංකීර්ණය,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : GOS/ADM/08/6/374
දිනය : 2022.04.26

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු නිලධාරි I ශ්‍රේණියේ තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

1. විභාගයේ/වෘත්තීය පරීක්ෂණයේ නම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ ක්‍රීඩා පුහුණුකරු I ශ්‍රේණියේ තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. විභාගය පිළිබඳ විස්තර : ( I ශ්‍රේණියට පත්වී වසර 05ක් ගතවීමට පෙර)

| ප්‍රායෝගික පරීක්ෂණය | මුලු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. පත්වීම් ලිපියේ හෝ රාජකාරී පැවරීමේ ලිපියේ වගකීම් පවරා ඇති ක්‍රීඩාවට අදාලව පුහුණු සැලැස්මක් ඉදිරිපත් කිරීම | 100 | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලයලත් ආයතනයක් / පුද්ගලයන්

4. විභාගය පවත්වනු ලබන කාල සීමාව : වසරකට වරක් හෝ අවශ්‍යතාව පරිදි

5. විභාගය සඳහා වන නිර්දේශය

| ප්‍රායෝගික පරීක්ෂණය | ක්‍රියාකාරකම |
|---|---|
| 1. පත්වීම් ලිපියේ හෝ රාජකාරී පැවරීමේ ලිපියේ වගකීම් පවරා ඇති ක්‍රීඩාවට අදාලව පුහුණු සැලැස්මක් ඉදිරිපත් කිරීම | ප්‍රායෝගික පුහුණු සැසියක සැලැස්මක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම |

අත්සන - ..........................................

නම - සිරිසෝම ලොකුවිතාන

තනතුර - අමාත්‍යාංශ ලේකම්

දිනය - 2022.01. 17

නිලමුද්‍රාව

204, 2 වන මහල, නව පළාත් සභා කාර්යාල සංකීර්ණය, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

ගොනු අංකය : WPGS/ADM/08/6/374

දිනය : 2022.04.26

## ශ්‍රේණි උසස්වීම් ලබාගැනීම සඳහා වූ අයදුම් පත්‍රය

1. නිලධරයා පිළිබඳ තොරතුරු

   1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..................................................................

   1.2 හැඳුනුම්පත් අංකය : ..................................................................

   1.3 සේවා ස්ථානය සහ එහි ලිපිනය : ..................................................................

   1.4 අයත් වන ශ්‍රේණිය හා තනතුර : ..................................................................

   1.5 අයත් වන සේවා ගණය හා ශ්‍රේණිය : ..................................................................

2. පත්වීම පිළිබඳ තොරතුරු

   2.1 පත්වීම් දිනය : ..................................................................

   2.2 පත්වීම ස්ථිර කළ දිනය : ..................................................................

   2.3 සමත්වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය :

| සමත්වූ කාර්යක්ෂමතා කඩඉම | සමත් වියයුතු දිනය | සමත්වූ දිනය |
|---|---|---|
| | | |
| | | |

   2.4 සමත්වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය :

| සමත්වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත් වියයුතු දිනය | සමත්වූ දිනය |
|---|---|---|
| | | |
| | | |

3. උසස්වීමට අදාළ තොරතුරු

   3.1 උසස්වීමට අපේක්ෂිත ශ්‍රේණිය : 11/1/විශේෂ

   3.2 උසස්වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය / සුවිශේෂී

   3.3.1 අවශ්‍ය සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කර තිබේ ද? ඔව් / නැත

   3.3.2 සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කළ දිනය : ..........................................

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : ගොස/ADM/08/6/374
දිනය : 2022.04.26

4. <u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරැදි බවත්, ඉහත නම සඳහන් ........................................ මහතා/මෙනවිය/මහත්මිය ........................................ සේවා ශ්‍රේණියේ ........... ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය/සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවටත් සෑහීමකට පත්වෙමි. ඒ අනුව එම නිලධාරියා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

07 FEB 2022

| | | |
|---|---|---|
| නම | : | ........................................ |
| අත්සන | : | ........................................ |
| දිනය | : | ........................................ |
| නිල මුද්‍රාව | : | ........................................ |

5. <u>අමාත්‍යංශ ලේකම්ගේ නිර්දේශය</u>

දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් දක්වා ඇති කරුණු නිවැරැදි බවත් / නිවැරැදි නොවන බවත් , ඒ අනුව ඉහත නිර්දේශ හා එකඟ වන බවත් / එකඟ නොවන බවත් කාරුණිකව දන්වමි.

| | | |
|---|---|---|
| නම | : | ........................................ |
| අත්සන | : | ........................................ |
| දිනය | : | ........................................ |
| නිල මුද්‍රාව | : | ........................................ |

6. <u>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් / පත්වීම් බලධරයා</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරැදි බවත්, ඒ අනුව ........................................ මහතා/මහත්මිය/මෙනවිය ............................ සේවා ශ්‍රේණියේ ........... ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය/සුවිශේෂී කාර්ය සාධනය යටතේ .................................. දින සිට උසස් කිරීම නිර්දේශ කර අනුමැතියට ඉදිරිපත් කරමි.

| | | |
|---|---|---|
| නම | : | ........................................ |
| අත්සන | : | ........................................ |
| දිනය | : | ........................................ |
| නිල මුද්‍රාව | : | ........................................ |
| | | (පරිපාලන බලධරයා) |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ලේඛන අංකය : GOS/ADM/08/6/374.
දිනය : 2022.04.26